මුහුදු වැද්දන් හෙවත් වෙරළබඩ වැද්දන්ගේ ජනජීවිතය පිළිබඳ විමර්ශනයක්

කේ. ආර්. ප්‍රේමවීර[1], අයි. එස්. වීරක්කොඩි[2] සහ ඒ. ඩී. වීරක්කොඩි[3]
[1]නාවික හා සාගරික විද්‍යාපීඨය; [2]සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය; [3]ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
katruwan@yahoo.co.in

පුලින්ද, සබර, ආදිවාසීන් ලෙස හඳුන්වන වැදි ජනයා වැද්දන්, ගම් වැද්දන්, හා වෙරළබඩ වැද්දන් වශයෙන් කොටස් තුනකි. මුහුදු වැද්දන් Coast Vaddas හෙවත් වෙරළබඩ වැද්දන් කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ. මුහුදු වැද්දන් යනු කවුරුන් ද, ඔවුන්ගේ ව්‍යාප්තිය කුමන ප්‍රදේශවල ද ගම් වැද්දන්ගෙන් වෙනස් වන්නේ කුමන ලක්ෂණ මත ද? ඔවුන්ගේ සංස්කෘතිය, ආර්ථික ක්‍රමය හා නව ප්‍රවණතා පිළිබඳව විවරණය කිරීම මෙහිදී අපේක්ෂිත ය. ලිඛිත සාහිත්‍ය අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය ද මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉහළ තෝප්පූර්, පාට්ටාලීපුරම්, ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මුහුදු වැදි ගම්මානය මෙහි පර්යේෂණ ප්‍රදේශය වන අතර, ජනගහනය 1,384 කි.

මුහුදු වැද්දෝ අතිදක්ෂ ධීවරයෝ ය. ඔවුන්ට විවිධ දැල් සෑදීම හා දැල් ඇදීම පිළිබඳ හසළ දැනුමක් තිබේ. ප්‍රධානම ජීවනෝපාය වශයෙන් හෙල්ලෙන් මසුන් ඇල්ලීම , මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිතව ඇති තල් හෝ පොල් ගස් ඇසුරෙන් රා මැදීම , කෘෂිකර්මාන්තය දැකිය හැකි වේ. ත්‍රස්තවාදී උවදුර, ඉඩම් හිඟය හා වනාන්තරවල ක්ෂයවීම යන හේතු කාරණා මත මොවුන් මෙවැනි දේ සඳහා අනුවර්තනය වී තිබෙන බව හඳුනා ගත හැකි ය. මුහුදු වැද්දන්ගේ ප්‍රධාන ඇදහීම වන්නේ තමන්ගේ මිය ගිය ඥාතීන් (උක්කි ආක්කල්) පිදීම ය. ඊට අමතරව කුංචි මාප්පා, මීනච්චි අම්මාන් පායිමත්තු තේවංගල්, කන්නිමාර් සහ ආණ්ඩියන් වැනි මුහුදට අධිපති දෙවිවරුන් ද ඔවුහු විශ්වාස කරති. මුහුද වැද්දන්ගේ චාරිත්‍ර හා ඇදහිලි බොහෝමයක් ම දෙමළ චාරිත්‍ර හා ඇදහිලි සමඟ සම්මිශ්‍රණය වී ඇති බව පෙනේ.මුහුදු වැද්දන්ගේ ආගමික විශ්වාසයන් අතර කපල්පෙයි, දම්මාල් සහ කෝමරා යන දෙවිවරුන් වන්දනාමාන කිරීම ද සුවිශේෂී තැනක් ගනී.

ආහාර හිඟකම පානීය ජල හිඟය,එල්ටීටීඊයේ තර්ජන වලට ලක්වීම,ස්ථිර රැකියාවක් නොමැතිවීම, ධීවර කර්මාන්තය බිඳ වැටීම, දඩයම් කිරිමට ඇති බාධා, කෘෂිකර්මයට පහසුකම් නොමැතිකම, ජල හිඟය,පොදු පහසුකම් ප්‍රමාණවත් නොමැතිකම මුහුණපාන ගැටලු කිහිපයකි.

ප්‍රමුඛ පදඃ *වැදි ජනයා, ජනශ්‍රැතිය, මුහුදු වැද්දන්, ජන ජීවිතය*